# පොසොන් දායාද

පියතිස් නිරිඳු දුනුදිය උරහිස රැඳුණු
විමසා බලයි කහවත දෙනෙතෙහි ඇඳුණු
සුළු ඇත් පදෝපම සුත දෙසවන බැඳුණු
මග හෙළි කළා ලොවකට සුව සෙත සැදුණු

මහ පඬිවරුන් බිහි වී පොත පත ලිව්වේ
මහ ගල් තලාවන් මත බුදු ගුණ මැව්වේ
බොදු සබඳතා ඇති වී යහගුණ වැව්වේ
අනුබුදු මිහිඳු පහසිනි අඹතල පව්වේ

නුබ ගැබ සිඹින ලද මහ දාගැබ් සැදුනේ
මුළු ලොව අනගිතම බිතු සිතුවම් ඇඳුනේ
කෙත් සරු සාර කළ මහ වැව් දිය බැඳුනේ
ඔබ වැඩි නිසාමය අනුබුදු හිමි සඳුනේ

සම්බුදු මහිම රැ දි නවගුණ අරහාදී
ජයසිරි මහා බෝ සමිඳුන් යන ආදී
බොදු දායාද හිමිවුන මහ පින පෑදී
සිහිවෙයි මහින්දාගමනය දවසේදී

සැදුහැති පිරිස මුනිගුණ පැහැදෙමින් හදේ
ආරාදනා ගල වෙත බැතිබරින් ඇදේ
සොමි සඳ සිසිල් දිය දහරින් පොසොන් සඳේ
අනුබුදු මිහිඳු පදලස බුහුමනින් පිදේ

**ජගත් වෙත්තසිංහ**
මෙල්බන්




සන්නස
නව සහශ්‍රයට
SANNASA

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe
**වර්ණ සංයෝජනය**
ඉනෝකා දිසානායක

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## මේ කොයි යන්නේ...?

ඔස්ට්‍රේලියාවෙන් ශාස්ත්‍රපති (Masters) උපාධියක් ලබා රටට සේවයක් කිරීමේ උදාර අරමුණෙන් ලංකාවට ගිය තරුණයකු අපට පසුගිය දා මෙල්බන්හිදී හමු විය.

''මං ආපහු ආවා..'' ඔහු කිවේ ය. ''මා එක්ක මාස්ටර්ස් කළ යාලුවෝ පස් දෙනෙක්ම ආපහු ලංකාවට ගියා. අපි ගියේ අපි ඉගෙනගත් දෙයින් අපේ රටට සේවයක් කරන්න හිතාගෙන. ඒත් ඒ පස් දෙනාමත් දැන් මෙහේ''

''ඇයි ඒ..?''

''කළකිරීම නිසා.. ලංකාවෙ දැන් තියෙන්නෙ වැඩක් කරන්න පුලුවන් පරිසරයක් නෙවෙයි. මං එකම උදාහරණයක් කියන්නම්. මං වැඩ කළේ කොල්ලුපිටියෙ තියෙන ආයතනයක. කොල්ලුපිටියට ගෙදර ඉඳන් යන පාරවල් ඔක්කොම එහෙන් මෙහෙන් වහලා. සමහර දවස් වලට මම පැය එකහමාරක් කාරෙකේ ඉඳලා තියෙනවා ඔෆිස් එකට යන්න බැරිව. ඉතින් හිතන්න කොහොමද මෙහෙම රටක් දියුණු වෙන්නෙ.''

රට හැර යන්නට හැකියාවක් ඇති බොහෝ බුද්ධිමතුන් රට හැර යමින් සිටින බව පාලකයන් නොදන්නා සේ ය. විදේශීය ආයෝජකයන් මතු නොව දේශීය ආයෝජකයන් පවා අලුතින් ආයෝජන නොකරන තත්ත්වයක් මතු වෙමින් තිබෙන බවත් රහසක් නොවේ. යුද්ධය හේතු කාරණාවක් කර ගනිමින් ජන ජීවිතය නිස්කාරණේ අඩාල කරන වාතාවරණයක් රට තුළ ගොඩ නැගීමේ වගකීම කාගේ ද?

නීතිය වල් වැදී ඇත. පාතාලය හිස ඔසවමින් සිටියි. තුවක්කුවේ බලය මත සියල්ල තීරණය වූ 88 - 89 වකවානුව නැවත සිහිගන්වන පරිසරයක් නිමවෙමින් තිබෙයි.

ශ්‍රී ලංකාව මේ යමින් සිටින්නේ කොයිබට ද?

## කැම්බෆීල්ඩ්

### සමාධි බෞද්ධ භාවණා මධ්‍යස්ථානයේ නව විහාරයට මුල්ගල් තැබූ දා



සේයාරූ: දසුන් ගජමන්

තවත් ඡායාරූප www.thisara.com වෙබ් අඩවියේ


ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුළුව. ගොඩවන්න අදම
www.thisara.com


## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.